**හොරණ ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 16 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ඔක්තෝබර් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම
----------------------------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශේෂ පත්‍රයේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්තාවේ 2.2.2(ඇ) ඡේදයේ දක්වා තිබූ වරද නිවැරදි කිරීම සඳහා සේවක ණය ගිණුම හර කර අත්තිකාරම් ගිණුම බැර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුම රු.246,967 කින් හර කර එම වටිනාකම සේවක ණය ගිණුමට බැර කර තිබීම නිසා සේවක ණය ගිණුමේ ශේෂය රු.493,934 කින් අඩුවෙන් හා අත්තිකාරම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබී තිබූ පොලිය රු.843,217 ක් ආයෝජන ගිණුම හර කර පොලී ආදායමට බැර කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කර තිබුණි.

(ඇ) ලෙජර ගිණුම අනුව ස්ථාවර තැන්පත් ආයෝජන ගිණුමේ ශේෂය රු.18,142,099 ක් වුවද ශේෂ පත්‍රයට එම ශේෂය රු.17,298,882 ක් ලෙස ගෙන තිබුණි.

(ඈ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාවට ලබා දී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථයේ ණය ශේෂය ගිණුම් ගත කර නොතිබූ අතර ඒ වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණයෙන් අයකර ගෙන තිබූ රු.706,273 ක් වූ ණය වාරික මුදල්ද ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ඉටු කර තිබූ කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.75,328,000 ක්ද, උපමාන පාදක ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු රු.60,869 ක් හා පළාත් නිශ්චිත ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු රු.298,991 ක්ද සඳහා ණයහිමි ප්‍රතිපාදනය කර නොතිබුණු අතර කර්මාන්ත වැය ලෙස ආදායම් හා වියදම් ගණුමටද ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ඉටු කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු රු.75,328,000 ක් කර්මාන්ත ණයගැති ගිණුමට සහ ප්‍රාග්ධන ආධාර ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(උ) ඉංගිරිය මහජන පුස්තකාලයට මිලදී ගෙන තිබූ රු.26,800 ක් වූ කොන්ක්‍රීට් මේස පුටු කට්ටල 02 ක් හා කොන්ක්‍රීට් බංකු 02 ක්ද, රු.310,500 ක් වූ තනිපැත්ත කබඩ් 09 ක් හා ළමා පුටු 20 ක්ද, ඉංගිරිය උප කාර්යාලයට මිලදී ගෙන තිබූ රු.37,360 ක් වූ කාර්යාල උපකරණද ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ) ආදායම් ලෙජර ගිණුමට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් ශේෂය රු.37,097,261 ක් වුවත් ශේෂ පිරික්සුමට රු.37,049,170 ක් ලෙස ගෙන තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ රු.8,747,725 ක ඌණතාවය සමුච්චිත අරමුදල් ගිණුමට මාරු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාලව උසාවි දඩ මුදලින් ලැබීම් රු.1,401,579 ක් හා 2013වර්ෂයට අදාල හිඟ මුදල රු.8,400,000 ක් වීම නිසා බිල් කළ ආදායම රු.9,801,579 ක් විය යුතු වුවත් ආදායම් හා වියදම් ගිණුමට බිල් කළ ආදායම ලෙස රු.8,400,000 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ලැබීම් රු.55,576,276 ක මුදලින් ඉකුත් වර්ෂයට අදාල ලැබීම් රු.52,405,612 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල රු.3,270,664 ක් හා ලැබිය යුතු වටිනාකම රු.25,641,025 ක් වීම හේතුවෙන් මුද්දර ගාස්තු බිල් කළ ආදායම රු.28,911,689 ක් වුවත් ආදායම් හා වියදම් ගිණුමට රු.25,641,025 ක් ලෙස සටහන් කර තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමේ මුද්දර ගාස්තු හා උසාවි දඩවලට අදාල ආරම්භක ශේෂය රු.35,803,601 ක් හා අනෙකුත් ආදායම්වලට අදාල හිඟ ආරම්භක ශේෂය රු.2,588,777 ක් වුවත් මුදල් ලැබීම් අනුව ඉකුත් වර්ෂයට අදාලව මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.52,405,612 ක් හා රු.3,436,842 ක් (රු.55,842,454) ක් වීම නිසා ආරම්භක ශේෂයේ ඌන ප්‍රතිපාදනය රු.20,038,853 ක් හිඟ හිටි වෙනත් ආදායම් ගිණුම හර කර අදාල ආදායම් විෂයයන්ට බැර කර නොතිබීම නිසා වර්ෂය අවසානයට හිඟ ආදායම් ගිණුමේ ශේෂය සහ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.20,038,853 කින් අඩුවෙන් දැක්විණ.

(ච) සමාලෝචිත වර්ෂයේ විවිධ තැන්පත් ගිණුමේ බැර පැත්තේ එකතුව රු.5,608,219 ක්ද, හර පැත්තේ එකතුව රු.2,214,443 ක්ද වීම නිසා ශේෂය රු.3,393,776 ක් වුවද ශේෂ පිරික්සුමට එම ශේෂය රු.3,489,957 ක් ලෙස සටහන් කිරීම නිසා රු.96,181 කින් බැර පැත්ත වැඩියෙන් දැක්විණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ සහික දීමනා රු.1,458,000 ක් බිල් කිරීම්වල ඇතුළත් වී නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 20,980,808 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,558,869 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,725,348 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 13,652 | 1,066 | 15,553 |
| (ii.) | බදු කුලී | 1,983 | 1,631 | 2,327 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 844 | 841 | 3 |
| (iv.) | වෙනත් ආදායම් | 823 | 823 | -- |

2:2:2 වරිපනම් බදු

(අ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.6,409,806 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.2,256,925 ක් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් හිඟව පැවතුණි.

(ආ) පෝරුවදණ්ඩ උප කාර්යාලයට අයත් ආයෝජන කලාපයක් ලෙස දක්වා ඇති ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත ශාලාවලින් 2008 වර්ෂයේ සිට පැවත එන රු.8,411,805 ක් වූ වරිපනම් බදු ශේෂය විගණිත දිනය වූ 2014 අගෝස්තු 29 දිනය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:3 අක්කර බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.449,736 ක් වූ අක්කර බදු ශේෂයක් විගණිත දිනය වූ 2014 අගෝස්තු 29 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:4 කඩකුලී

ඉංගිරිය උප කාර්යාලයට අයත් නව වෙළඳ සංකීර්ණයේ සහ පොදු වෙළඳපල කඩකාමරවලින් රු.116,000 ක හිඟ කුලී ශේෂයක් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් හිඟව පැවතුණි.

2:2:5 ඉඩම් විකිණීම මත බදු

(අ) 2013 වර්ෂයේ සිදු කර තිබූ ඉඩම් විකිණීම්වලදී සියයට 1 ක බදු මුදල් වශයෙන් රු.1,618,682 ක ප්‍රමාණයක් අයකර ඇතත් එම මුදල ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 ක් වූ අතර1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩමේ විකුණුම් වටිනාකමින් සියයට 1 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හෝම්ලැන්ඩින් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම විසින් සිදු කරනු ලබන ඉඩම් වෙන්දේසියක් සඳහා කුඹුක කහටගහවත්ත ඉඩමේ අනු බෙදුම් සැළැස්ම 2013 නොවැම්බර් 25 දින සභාව විසින් අනුමත කර තිබුණද, විගණිත දිනය වූ 2014 අගෝස්තු 30 දින වන විටත් ඊට අදාල සියයට 1 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 **<u>අත්තිකාරම් ගෙවීම්</u>**

අත්තිකාරම් ලේඛනය අනුව 2008, 2009 හා 2012 වර්ෂවල ගෙවා තිබූ රු.8,119 ක් වූ අත්තිකාරම් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(ආ) අනුව විගණිත දිනය වූ 2014 අගෝස්තු 29 දිනටද පියවා නොතිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට අය විය යුතු අත්තිකාරම් ශේෂය රු.4,184,991 ක් විය.

3.2 **භාණ්ඩ සමීක්ෂණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 හා 2013 වර්ෂයන් සඳහා 2014 අගෝස්තු 29 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි.

(ii) 2011 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කළ යුතු ලෙස දක්වා තිබූ භාණ්ඩ, කනන්විල හා පොකුණුවිට උප කාර්යාලයන්ගේ ඉන්වෙන්ට්‍රි ලේඛනවල 2014 අගෝස්තු 29 දින තෙක් සටහන් කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ 'ඒ' උපවගන්තිය අනුව අමාත්‍යවරයාගේ කිසිදු අනුමැතියක් ලබාගැනීමෙන් තොරව හා වර්ෂයකට රුපියල් දහසක උපරිම සීමාවට අනුගත නොවී අඩු ආදායම් ලාභී පවුල් සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීමට හා ප්‍රජා මණ්ඩල සඳහා ද්‍රව්‍ය ආධාර ලබා දීම වෙනුවෙන් රු.2,510,339 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි අනුමැතිය ලබාගැනීමෙන් තොරව පහත සඳහන් වියදම්ද 2013 වර්ෂයේ සභා අරමුදලින් දරා තිබුණි.

(i) කිරි අම්මාවරුන්ගේ දිනය සැමරීම වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සඳහා බැනර් මුද්‍රණය වෙනුවෙන් රු.17,600 ක් හංසි ඇඩ්වටයිසින් ආයතනයට 2013 නොවැම්බර් 05 දින ගෙවා තිබුණි.

(ii) ඉංගිරිය තරුණ බෞද්ධ සංගමයක් විසින් සංවිධානය කර තිබූ ඇසල කලාපයේ විදුලි ආලෝකය සැපයීම සඳහා වැය වන මුදල වශයෙන් රු.20,000 ක් එම සංගමයට සමාලෝචිත වර්ෂය තුළදී සභා අරමුදලින් ගෙවා තිබුණි.

(iii) ඉංගිරියේ ප්‍රජා මණ්ඩලයක් විසින් පවත්වා තිබූ දීපාවලී උත්සවයට අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් රු.30,000 ක් එම ප්‍රජා මණ්ඩලය වෙතට 2013 වර්ෂය තුළදී ගෙවීම් කර තිබුණි.

3.4 **වාහන පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාහන 24 ක් සභාවේ පැවතුණද, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව හා මු.රෙ. (ii) කාණ්ඩය VI වන උපලේඛනයේ දක්වා ඇති නියමයන් අනුව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ii) සභාවේ කිසිදු වාහනයකට අදාල මාසික සාරාංශ සකස් කර නොතිබූ අතර ධාවන සටහන්ද ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41-90 ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පිළිබඳව මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි.

(iv) 2014 අගෝස්තු 28 දින සභාවේ වාහන 07 ක ධාවන සටහන් හා වාහනයේ මීටරය භෞතික පරීක්ෂාවට ලක් කිරීමේදී ඒ සියළුම වාහනවල මීටරය ක්‍රියාවිරහිතව තිබූ බව නිරීක්ෂණය වූ අතර වැඩිදුර පරීක්ෂාවේදී එම මීටර් වර්ෂ ගණනාවකට පෙර කැඩී තිබූ නමුත් එවා නැවත සවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) මෝටර් ග්‍රේඩරයට අදාල ධාවන සටහන් අනුව වාහනය මාර්ග තැනීම සඳහා යොදාගෙන තිබූ නමුත් ඒ කිසිදු කාර්යයක් සඳහා ඉදිරි වැඩ සැළැස්මක්, කාර්ය සඳහා අනුමත ඇස්තමේන්තු නොතිබූ අතර සභාපති විසින් ලබා දෙන උපදෙස් මත සේවයේ යොදවා තිබුණි.

3.5 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

2013 දෙසැම්බර් 30 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 166 ක් වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලය 152 ක් විය. ආදේශක පදනමට සේවකයින් 19 දෙනෙකුද ව්‍යාපෘති කාර්ය

මණ්ඩලය ලෙස සේවකයින් 37 දෙනෙකුද බඳවාගෙන තිබූ අතර ස්ථිර තනතුරු 09 ක සේවකයින් 12 දෙනෙකුගේ ඌනතාවයක් විය.

3.6 <u>ගමන් වියදම්</u>

2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභාපති විසින් ගමන් වියදම් වවුචර් පත් ඉදිරිපත් කර දින 247 ක් වෙනුවෙන් සංයුක්ත දීමනා ලෙස රු.123,500 ක් ලබාගෙන තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාපති විසින් යම් ගමන් වියදම් හෝ සංයුක්ත දීමනාවක් ලබාගැනීමේදී එම ගමනට අදාල කාර්යය යම් තීරණයක් මගින් සභාපතිට පැවරු කාර්යයක් බවට හෝ සභාවේ පරිපාලන කාර්යයක් සඳහා වූ ගමන් බවට හෝ යම් ආයතනයක් මගින් සභාපති කැඳවූ අවස්ථාවක් ලෙසට තහවුරු කෙරෙන සාක්ෂියක් ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමෙන් තොරව ඉහත සඳහන් සංයුක්ත දීමනා ලබා ගෙන තිබුණි.

(ii) එම ගමන් වියදම් වවුචර්පත් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාවේදී 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පවත්වා තිබූ මහා සභා රැස්වීම් දින 12 න් දින 11 ක් සඳහාම සභාපති රැස්වීමට සහභාගි වී දීමනා ලබා තිබූ අතර ඉහත ගමන් වියදම් වවුචර්පත් ඉදිරිපත් කර ලබා ගෙන තිබූ සංයුක්ත දීමනා තුළ එම දිනයන්ද ඇතුළත් වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මුදල කමිටු හා කර්මාන්ත කමිටු සඳහා 2013 වර්ෂයේදී දින 13 ක් රැස්වී තිබූ අතර ඒ සැම දිනකම සභාපති සහභාගි වී ඉහත ගමන් වියදම් ගෙවීම් තුළ එම දින සඳහාද සංයුක්ත දීමනා ලබා තිබුණි.

(iv) එසේම 2013 වර්ෂයේ දින 76 කදී පවත්වා තිබූ සැලසුම් කමිටු සඳහා සභාපති සහභාගි වී අදාල දමනා ලබා ගෙන තිබූ අතර එම දින වෙනුවෙන්ද සංයුක්ත දීමනා ලබා ගෙන තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ ගමන් වියදම් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.316,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එය ප්‍රමාණවත් නොවීම නිසා 2013 ඔක්තෝබර් 22 දින පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු.100,000 ක ප්‍රතිපාදනයක්ද අනුමත කරගෙන තිබුණි.

3.7 <u>සේවක ණය</u>

(i) 2011 වර්ෂයේ සිට පැවත එන සේවය හැර ගිය නිලධාරීන් 14 ක ගෙන් අයවිය යුතු රු.111,461 ක ණය ශේෂයක්ද අයකරගැනීමට 2014 අගෝස්තු 29 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) සභාවේ නිලධාරීන් විසින් ලබාගෙන තිබූ දේපල ණය වෙනුවෙන් 2013 වර්ෂයේදී සභාව විසින් ගෙවා තිබූ එකතුව රු.178,369 ක් වූ පොලී මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට විගණිත දින වන 2014 අගෝස්තු 29 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධත හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) අයවැයකරණය
(iii) ආදායම් පරිපාලනය
(iv) වත්කම් කළමනාකරණය
(v) මානව සම්පත් කළමනාකරණය